**බේරුවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 02 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 25 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු රු.7,628,090 ක මුදල ණය හිමියන් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආදායම රු.161,258 කින් හා ලැබිය යුතු කර්මාන්ත අධාර මුදල රු.815,171 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලි ආදායම රු.276,706 ක් අඩුවෙන් ගිණුම්ගත කර දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.1,720,811 ක්වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | තොග වටිනාකම ලෙස භෞතික තොග වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (v) | කසළ බඳුන් 50 ක් මිලදී ගැනිම සඳහා වැය කර තිබු රු.245,000 ක මුදලක් මෝටර්රථ හා කරත්ත ගිණුමෙහි දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vi) | ලී බඩු සවිකිරිම් හා කාර්යාල උපකරණ උපලේඛනයේ 2016 සිදුවී ඇති වැරදි නිවැරදි කිරිම යනුවෙන් රු.37,500ක් දක්වා තිබුණු අතර ඒ පිළිබඳව විස්තර ඉදිරිපත් කර නොතිබුණි | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vii) | ශබ්ද විකාශන පද්ධතියක් ස්ථාපිත කිරිම වෙනුවෙන් වැය කර තිබුණු රු.1,021,000 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (viii) | ප්‍රාදේශිය සභාවේ කාර්යයන් පරිගණක ජාලගත කිරිම වෙනුවෙන් වැය කර තිබුණු රු.4,645,000 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ix) | මග්ගොන පොදු වෙළඳපොල පුළුල් කිරිම සඳහා ඉඩම් පවරා ගැනීමේ වන්දි වශයෙන් බේරුවල ප්‍රාදේශිය ලේකම්ට ගෙවා තිබුණු රු.11,000,000 ක තැන්පත් මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර ඉඩම් හා ගොඩනැගිලි යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද , ඉඩම් පවරා ගැනිමේ කටයුතු සඳහා පරිපාලන වියදම් වශයෙන් ගෙවා තිබු රු.300,000 ක මුදල ද අත්තිකාරම් යටතේ නොදක්වා ප්‍රාග්ධන වැය යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (x) | කම්පැක්ටර් රථයේ වාරික වශයෙන් රු.2,983,500 ක මුදලක් ගිණුම්වල ගැලපිය යුතු වුවත්, එය රු.994,500 ක් වශයෙන් ගැලපීම හේතුවෙන් උපයෝගි සේවා ගිණුම හා පළාත් සභා කම්පැක්ටර් රථ ගිණුම රු.1,989,000 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,373,537 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.103,420 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | පරිගණකගත කිරිමේදී සිදු වූ අඩුපාඩු බැවින් නිවැරදි කර ගැනීමට අදාල නිලධාරින්ට උපදෙස් දෙමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයිතිය තහවුරු කරන හිමිකම් ඔප්පු හෝ පැවරුම් නියෝග , සමික්ෂණ වාර්තා , ලැබිය යුතු මුද්දර ගාස්තු ලේඛනය හා උප ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.304,063,936 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | නිවැරදි කිරිමට පියවර ගතිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රිති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | සියලු ඉඩම් ගොඩනැගිලි පරික්ෂාවට ලක් කිරිම සඳහා කටයුතු යොදා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 104 | - | ට්‍රැක්ටරයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුවේ. | අදාල වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර වාර්තාවක් ලබාදෙන ලෙස අභ්‍යන්තර විගණන නිලධාරියාට දන්වා ඇත. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය | - | වාහන 33 ක ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | සභාවේ සියළුම වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය | 2,420,000 | ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ සුදුසුකම් පරීක්ෂා නොකර කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,032,903ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.55,699,159 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,510,508 | 23,988,856 | 11,632,353 | 12,356,503 | 15,266,375 | 17,403,708 | 18,873,253 | 12,902,511 |
| (ii) | කුලී | 19,077,408 | 20,102,792 | 16,703,957 | 3,398,835 | 25,834,430 | 15,282,815 | 15,682,994 | 3,139,393 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,142,500 | 4,716,131 | 4,602,131 | 114,000 | 4,400,630 | 4,263,287 | 4,253,287 | 10,000 |
| (iv) | වෙනත් ආදායම් | 50,600,000 | 50,600,000 | 42,149,902 | 85,818,970 | 53,992,495 | 44,000,000 | 46,506,665 | 79,622,624 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් සියයට 71 ක් වර්ෂය අවසානය වන විට අය නොවී පැවති අතර වාර්ෂික බිල් කිරීම්වලින් සියයට 52 ක් ද අයකරගෙන නොතිබුණි. හිඟ වරිපනම් බදු ශේෂය තුල වර්ෂ 05-10 ක් අතර හිඟය රු.1,224,731ක් හා වර්ෂ 10 ට වඩා වැඩි හිඟය රු.356,615 ක් වූ අතර හිඟ ශේෂය තුල රු.10,000 ඉක්මවූ ඒකක 127 ක් හා රු.50,000 ට වැඩි ඒකක 07 ක් විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් ආදායම රැස් කිරීමට කටයුතු කරමි. |
| **(ආ) ව්‍යාපාර බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ව්‍යාපාර බදු රු.872,460 ක් වූ අතර ඉන් වර්ෂ 01 අඩු හිඟය රු.577,100 ක් ද , වර්ෂ 01-03 ත් අතර හිඟය රු.203,360 ක් සහ වර්ෂ 03-05 අතර හිඟය රු.92,000 ක්ද විය. | හිඟ ව්‍යාපාර බදු අයකර ගත යුතුවේ. | හිඟ අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. |
| **(ඇ) කඩකුලී** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.3,081,150 ක් වූ හිඟ කඩකුලී | හිඟ කඩකුලී කඩිනමින් අයකර ගත යුතුවේ. | දැනට ගිවිසුම් පවතින කඩ 11 ක් සඳහා එන්තර |

| | | |
|---|---|---|
| ශේෂයෙන් සියයට 57 ක් අයවිය යුතුව තිබු අතර වර්ෂය අවසානයට මුළු හිඟහිටි කඩකුලි ශේෂය වු රු.3,598,900 න් වර්ෂ 01-03 ත් අතර කාලයට අදාළ රු.681,347 ක් හා වර්ෂ 03-05 අතර කාලයට අදාළ රු.1,749,802 ක් විය. | | වාසියක් යවා ඇත. ගිවිසුම් නොමැති කඩ බිල් කිරීම්ද ලේඛන වල සටහන්ව ඇත. හිඟ පවතින ගිවිසුම් ඇති කඩ සඳහා නඩු පැවරීමට කටයුතු කරමි. |
| (ඇ) වෙනත් ආදායම් | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟය වු රු.1,645,225 න් වර්ෂ 01-03 දක්වා කාලයට අදාල හිඟය රු.47,500 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| (ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.21,007,602 ක් හා මුද්දර ගාස්තු රු.64,811,368 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තුඅයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබාදී නැත. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 10 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | ඉතිරි කරුණු වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| | | |
|---|---|---|
| (i) 2018 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා අත්මුදල් අවශ්‍යතාවය තීරණය කර අත්මුදල් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැසම සමඟ අත් මුදල් සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව කිරිමට කටයුතු සිදු කරමි. |
| (ii) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා වැඩ සටහන් 05 ක් යටතේ ක්‍රියාකාරකම් 157 හඳුනාගෙන , ඒ සඳහා වගකිව යුතු නිලධාරින් අධීක්ෂණය සඳහා පත් කලද , එහි ප්‍රගතිය මැන බැලීමේ ක්‍රම වේදයක් සභාව සතුව නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව කිරිමට කටයුතු සිදු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් සඳහා නුසුදුසු ඉතා බෑවුම් සහිත ඉඩම් කට්ටි දෙකක් ලබාගෙන තිබූ අතර ලැබී තිබුණු තවත් ඉඩම් කට්ටි තුනක් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි. | පොදු පහසුකම් සඳහා බිම් කැබලි ලබා ගැනිමේදී ඊට යෝග්‍ය බිම් කොටසක් ලබා ගත යුතු අතර ඒවා අදාල කාර්යය සඳහා යොදා ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) රාජ්‍ය නොවන සංවිධානයක මුදල් ආධාරයෙන් 2013 වර්ෂයේදී අළුත්ගම සති පොළ පවතින ස්ථානයේ නවීකරණය කල කඩ කාමර 38 කින් 2019 මැයි 29 වන විටත් විවෘත කර තිබුණේ කඩ කාමර 03 ක් පමණි. මාර්ගයට විවෘත වන සේ සැලසුම් කර නොතිබීමෙන් කඩ කාමර බදු දීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී කරණු ලබන ඉදි කිරිම් සඳහා නිසි පරිදි සැලසුම් කර ඉදි කිරිම් කටයුතු සිදු කරමි. |
| (ඇ) සභාව විසින් රු.570,000 ක් වැයකර ඇඟිලි සළකුණු යන්ත්‍ර 06 ක් මිලදි ගෙන තිබුණු අතර එකී යන්ත්‍ර මිලදී ගැනිමේදී ඒ සඳහා පිරිවිතර සකස් කිරිමකින් තොරව නිලධාරින් 275 ක් සඳහා ඇඟිලි සළකුණු 8000 ක ධාරිතාවයකින් යුක්ත යන්ත්‍ර මිලදී ගෙන තිබුණි. | අවශ්‍යතාවය අනුව ගුණත්වයෙන් හා කල් පැවැත්මෙන් යුතු යන්ත්‍ර මිලදී ගත යුතු වේ. | ඇගයිම් කමිටුවේ හා තාක්ෂණ කමිටුවේ නිර්දේශ මත මිලදී ගතිමි. අකුණු සැර වැදීම නිසා යන්ත්‍ර අක්‍රිය වි ඇත. අළුත්වැඩියා කිරිමට නොහැකි වු යන්ත්‍ර දෙකක් නැවති මිලදී ගතිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>---------------------------------- | | |
| (අ) තනතුරු 10 කට අදාලව පුරප්පාඩු 34 ක් පැවතුනි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුවේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| (ආ) වෙළඳසැල් පරීක්ෂක තනතුරේ එක් අයෙකු හා අනියම් , තාවකාලික , කොන්ත්‍රාත් සේවකයින් පනස් දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | එම තත්ත්වය පිළිබඳ සොයා බලා පාලනය කිරිමට කටයුතු කල යුතුවේ. | එක් එක් අංශ වල ඇතිවූ සේවා අවශ්‍යතාවය මත අතිරේක සේවකයින් බඳවා ගැනීමට සිදු විය. |

3.4 වත්කම් කළමණාකරණය
-----------------------------

3.4.1 පවරා නොගත් වත්කම්
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| අක්කර 08 පර්චස් 3.41 ක් වූ හල්කඳවිල ගොන්නගහවත්ත ඉඩම කට්ටි කර විකිණීමේදී පොදු පහසුකම් වෙනුවෙන් ඉඩම් කොටසක් සභාවට ලබාගෙන නොතිබුණි. | පොදු පහසුකම් වෙනුවෙන් කොටසක් වෙන් කර සභාව වෙත පවරා ගත යුතුවේ. | පොදු බිම් කොටසකට අදාල වටිනාකම අයකර ගැනීමට කටයුතු කරමින් සිටිමි. |

3.4.2 නිශ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| (අ) කසළ කළමනාකරණය වෙනුවෙන් 2018 වර්ෂයේ ලැබී තිබුණු කවෂිමා කොම්පොස්ට් යන්ත්‍රය නිශ්ක්‍රියව පැවතුණි. | අළුත්වැඩියා කර අදාල කාර්යය සඳහා යොදාගත යුතුවේ. | ගාල්ල මහ නගර සභාව වෙත ලබා දීමට කටයුතු කරමින් සිටිමි. |
| (ආ) සභාව සතු කඩ කාමර 42 ක් බදු දිමකින් තොරව නිශ්ක්‍රියව පැවතුණි. | බදු දීමට කටයුතු කල යුතුවේ. | බදු දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. |

3.5 ප්‍රසම්පාදනය
---------------

3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වටිනාකම රු.මි.3.10 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගත යුතුවේ. | අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. |
| (ආ) ඉදි කර තිබූ මාර්ගයන් 03 ක වැඩ විස්තරයට අනුව භාවිතා කලයුතු රේටය වෙනුවට වැඩි රේටයන් භාවිතා කර ගෙවීම් කිරීම් නිසා රු.118,850 ක් වැඩිපුර කොන්ත්‍රාත් සමිති වෙත ගෙවා තිබුණි. | මාර්ග ගාස්තු උප ලේඛනයේ සඳහන් රේටයන් භාවිතා කල යුතුවේ. | කොන්ත්‍රාත් සමිති වෙත වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3.5.2 සැපයීම් හා සේවා
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල 05 හි කාර්යාල කටයුතු පරිගණක ජාලගත කිරිම වෙනුවෙන් 2018 වර්ෂයේදි රු.4,645,000 ක මුදලක් වැය කර තිබුණි.<br>මුදල් ගෙවීම් කර වසරකුත් මාස 02 ක් ගතවී තිබුණ ද පරිගණක ජාලගත කිරිම කර නොතිබුණි. | කඩිනමින් අදාල කාර්යය නිම කල යුතුවේ. | අදාල ජාලගත කිරිම් සිදුකර ක්‍රියාවට නංවා ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී කසළ වැසීම සඳහා යොදන ලද පස් මිලදී ගැනීම වෙනුවෙන් රු.9,023,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි.වර්ෂයේ මුල් මාස 04 හි සාමාන්‍යයෙන් දිනකට පස් කියුබ් 22 බැගින් ද, අවසන් මාස වල සාමාන්‍යයෙන් දිනකට පස් කියුබ් 13 ක් බැගින් යොදා තිබුණි. මුල් මාස වල දිනකට පස් කියුබ් 09 ක් වැඩිපුර යොදා තිබුණු අතර යොදන ලද පස් වල මිණුම් ලබා ගැනිමක් කර නොතිබුණි. | යොදන ලද පස් සඳහා තාක්ෂණ නිලධාරියෙකුගේ අධීක්ෂණය හා මිණුම් ලබාගත යුතු වේ. | අසාමාන්‍ය ලෙස අධික වූ කසල තුනී කිරිම සඳහා වැඩිපුර පස් දැමීමට සිදු විය. |